තේමාව - ජලය
විෂය - චිත්‍ර
පන්තිය - 6 ශ්‍රේණිය
පාඩම - 1.1.2 ජලය ආශ්‍රිතව නිතර දකින සතුන් සොයමු, බලමු, අඳිමු, හඳමු
අරමුණ - ජලජ පරිසරය අධ්‍යයනය
(නිපුණතා හා නිපුණතා මට්ටම) - සත්ත්ව ඉරියව්
- නිර්මාණශීලී චින්තනය
- සරල හැඩ ඇඹීම හා ගොඩනැගීම

---

## 01. පෙර ඉගෙනුම

- ජලය ආශ්‍රිත පරිසරය ආශ්‍රිතව නිතර දකින සතුන්ගේ විවිධත්වයන් අධ්‍යයනය කරන්න.
- ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින සතුන්ගේ පින්තූර, ඡායාරූප සහ ඔබ විසින් අඳින ලද ජලජ සතුන්ගේ රේඛා සටහන් එක් රැස් කරගන්න.
- ඔබ සිත්ගත් ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින එක් සතෙකුගේ රූපයක දළ සටහනක් අඳින්න.
- ඔබ අඳින ලද ඔබේ සිත්ගත් ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දුටු සත්ත්ව රූපය නිර්මාණශීලී ත්‍රිමාණ රූපයක් බවට පත් කිරීමට අවශ්‍ය දෑ රැගෙන එන්න.
  උදා:- මැටි/ ඉවතලන වර්ණවත් රෙදි කැබලි/පුළුන් වර්ණ, ගම්, කතුරු හා අවශ්‍ය වෙනත් ද්‍රව්‍ය

## 02. පන්තිකාමර ඉගෙනුම

- ජලය ආශ්‍රිත පරිසරයේ නිතර ගැවසෙන සතුන් දැක්වෙන ඔබ ඇඳි දළ සටහන පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- නිර්මාණශීලීව ගොඩනගන ලද සත්ත්ව ඉරියව් සහිත ආදර්ශ මූර්ති, කැටයම්, ත්‍රිමාණ නිර්මාණ ප්‍රදර්ශනය කිරීම.
- දරුවන් රැගෙන ආ ද්‍රව්‍ය භාවිතා කරමින් නිර්මාණශීලීව ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින සත්ත්ව රුවක් ඇඹීම/ එකලස් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.
- දරුවන් නිර්මාණකරණයේ යෙදවීම හා අවශ්‍ය තැන්හිදී ප්‍රතිපෝෂණ ලබා දීම.
- දරුවන්ගේ නිර්මාණ පන්ති ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- දරුවන්ගේ නිර්මාණ අගය කිරීම හා දිරි ගැන්වීම.

## 03. පසු ඉගෙනුම

- ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින තවත් සත්ත්ව රූප ඇසුරින් විවිධ නිර්මාණ කළ හැකිය. ඒ සඳහා විවිධ ක්‍රම හා මාධ්‍ය සොයා බලා නව නිර්මාණ සඳහා සිසුන් පෙළඹවීම.
- නිර්මාණකරණය සඳහා පාදක කර ගත හැකි මාර්ග බොහෝ ඇති බව අවබෝධ කරදීම.

පාඩම ඉගෙනීම සඳහා අවශ්‍ය සහාය ලබාගත හැකි මුද්‍රිත, ශ්‍රව්‍ය, දෘශ්‍ය online මාධ්‍යය.

I. පාරම්පරික කලාකරුවන්ගේ නිර්මාණ
II. අන්තර්ජාලය/ යූ ටියුබ් චැනලය